## උපදෙස්

- අදාළ නිලධාරියා තමන් සේවය කරන වත්මන් තනතුරේ සහ කලින් දැරූ තනතුරු වල සේවය ස්ථිර වී තිබිය යුතුය.

- දැනට ත්‍රිවිධ හමුදාවට අයත් නිත්‍ය/ ස්වේච්ඡා බල සේනාවන් වෙතින් කොආවි වෙත අනුයුක්තව සිටින්නේ නම්, මෝටර් රථ බලපත්‍ර ඉල්ලුම්පත එම නිලධාරියාට අදාල හමුදාපති මගින් යොමු කල යුතුය.

- අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමේදී අවිධිමත් ලෙස මකා දැමීම්, ඉරි ඇඳීම් හෝ ටිපෙක්ස් තවරා මකා දැමීම් නොකල යුතු අතර, වැරදීම් තනි ඉරකින් කපා නැවත පැහැදිලිව ලියා ඒ ඉදිරියේ තම අත්සන තබා සහතික කල යුතුය.

---

## අයදුම්පත සමඟ අවශ්‍ය ලිපිලේඛන

i. පත්වීමේ ලිපියේ ඡායා පිටපතක්.

ii. බඳවා ගන්නා අවස්ථාවේදී නිලධාරියා සතුව තිබූ සුදුසුකම් (උපාධි සහතික සහ පෙර සේවා සහතික වල ඡායා පිටපත්).

iii. සේවය ස්ථිර කල ලිපිවල ඡායා පිටපත්(Copy of the Confirmation Letter).

iv. මීට ප්‍රථම බඳු ප්‍රතිපත්තිය යටතේ මෝටර් රථයක් ලබාගෙන ඇත්නම් එහි පහත සඳහන් කර ඇති විස්තර ඉදිරිපත් කරන්න.

    - මෝටර් රථය ලියාපදිංචි සහතිකයේ ඡායා පිටපතක්.(ඔබ සතුව පවතින්නේ නම් පමණක්).
    - පෙර ලබාගත් මෝටර් රථ බලපත්‍රය සඳහා අනුමැතිය ලද ලිපියේ ඡායා පිටපතක්.
    - මෙයට පෙර කුමන හෝ සහනදායී මෝටර් රථ බලපත්‍ර යෝජනා ක්‍රමයක් යටතේ අවසන් වරට ලබාගත් බලපත්‍රය වෙනුවෙන් අනුමැතිය ලද දින සිට වසර (5)ක සක්‍රීය සේවා කාලයක් සම්පූරණ කර ඇති බවට දිවුරුම් ප්‍රකාශයක් (Affidavit).

v. මීට ඉහත දී බඳු ප්‍රතිපත්තිය යටතේ වාහන ලබාගෙන නොමැති බවට නිලධාරියා විසින් සහතික කරන ලද ලිපියක් උපකුලපතිතුමා වෙත (ප්‍රථම වතාවට ඉල්ලුම් කරන අයදුම්කරුවන් සඳහා පමණි).

vi. ජාතික හැඳුනුම්පතේ සහ කොආවි රාජකාරි හැඳුනුම්පතේ ඡායා පිටපත්.

වැඩිදුර තොරතුරු/ විස්තර සඳහා අදාල වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2018 වෙත පිවිසෙන්න. https://kdu.ac.lk/registrar-office/wp-content/uploads/2022/02/Annex-1.pdf.